# 7. කම්මපථවග්ගො

## 4. 7. 1.

## [පාණාතිපාතසුත්තං]

[සාවත්ථිනිදානං]

1. චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි චතූහි?

අත්තනා ච පාණාතිපාතී හොති, පරඤ්ච පාණාතිපාතෙ සමාදපෙති, පාණාතිපාතෙ ච සමනුඤ්ඤො හොති, පාණාතිපාතස්ස ච වණ්ණං භාසති

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි චතූහි?

අත්තනා ච පාණාතිපාතා පටිවිරතො හොති, පරඤ්ච පාණාතිපාතා වෙරමණියා සමාදපෙති, පාණාතිපාතා වෙරමණියා ච සමනුඤ්ඤො හොති, පාණාතිපාතා වෙරමණියා ච වණ්ණං භාසති.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

## 4. 7. 2

## [ අදින්නාදානසුත්තං ]

2. චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි චතූහි?

අත්තනා ච අදින්නාදායී හොති, පරඤ්ච අදින්නාදානෙ සමාදපෙති, අදින්නාදානෙ ච සමනුඤ්ඤො හොති, අදින්නාදානස්ස ච වණ්ණං භාසති. ඉමෙහි ඛො -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.]

[චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

අත්තනා ච අදින්නාදානා පටිවිරතො හොති, පරඤ්ච අදින්නාදානා වෙරමණියා සමාදපෙති, අදින්නාදානා වෙරමණියා ච සමනුඤ්ඤො හොති, අදින්නාදානා වෙරමණියා ච වණ්ණං භාසති. ඉමෙහි ඛො -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.]

## 7. කම්පථ වග්ගය

### 4. 7. 1.

### [ පාණාතිපාත සූත්‍රය ]

[සැවැත් නිදානයි]

1. මහණෙනි, සතර කරුණෙකින් සමන්‍විාගත වූයේ ගෙණවුත් බහා තැබූයේ යම්සේ වේ ද, එ පරිදි නිරයෙහි වේ. කවර සතර කරුණින යත්:

තෙමේත් පණිවා කරන්නේ වෙයි. මෙරමාත් පණිවායෙහි සමාදන් කරවයි. පණිවායෙහි ද අනුදන්නේත් වෙයි. පණිවා පිළිබඳ ගුණ කියන්නේත් වෙයි.

මහණෙනි, මේ සතර කරුණින් සමන්‍විාගත වූයේ ගෙණවුත් බහා තැබූයේ යම්සේ වේ ද, එ පරිදි නිරයෙහි වේ.

මහණෙනි, සතර කරුණෙකින් සමන්‍විාගත වූයේ ගෙණවුත් බහා තැබූයේ යම්සේ ද, එපරිදි සවර්ගයෙහි වේ. කවර සතර කරුණින යත්:

තෙමේත් පණිවායෙන් දුරු වූයේ වෙයි. මෙරමාත් පණිවායෙන් දුරු විමෙහි සමාදන් කරවයි. පණිවායෙන් දුරු විමෙහි අනුදන්නේත් වෙයි. පණිවායෙන් දුරු වීම පිළිබඳ ගුණ කියන්නේත් වෙයි.

මහණෙනි, මේ සතර කරුණින් සමන්‍විාගත වූයේ ගෙණවුත් බහා තැබූයේ යම්සේ ද, එසෙයින් සවර්ගයෙහි වේ.

### 4. 7. 2

### [ අදින්නාදාන සූත්‍රය ]

2. මහණෙනි, සතර කරුණෙකින් සමන්‍විාගත වූයේ ගෙණවුත් බහා තැබූයේ යම්සේ වේ ද, එපරිදි නිරයෙහි වේ. කවර සතර කරුණෙත යත්:

තෙමේත් අයිනාදන් ගන්නේ වෙයි, මෙරමාත් අයිනාදනෙහි සමාදන් කරවයි. අයිනාදනෙහි ද අනුදන්නේ වෙයි. අයිනාදන පිළිබඳ ගුණ කියන්නේ වෙයි. මහණෙනි, මේ සතර කරුණින් .. [ගෙණ වුත් බහා තැබූයේ යම් සේ ද, එ පරිදි නිරයෙහි වේ.]

[මහණෙනි, සතර කරුණෙකින් සමන්‍විාගත වූයේ...]

තෙමේත් අයිනාදනින් දුරුවූයේ වෙයි, මෙරමාත් අයිනාදනින් දුරු-විමෙහි සමාදන් කරවයි. අයිනාදනින් දුරුවිමෙහි අනුදන්නේත් වෙයි. අයිනාදනින් දුරුවීම පිළිබඳ ගුණ කියයි. මහණෙනි, මේ සතර කරුණින් ... [ගෙණ වුත් බහා තැබූයේ යම් සේ ද, එ පරිදි සවර්ගයෙහි වේ.]